# ජාතික කියවීමේ මාසය

ඔක්තෝබර් 2012

# සමරු කලාපය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික කියවීමේ මාසය

## ඔක්තෝබර් 2012

## **සමරු කලාපය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ජාතික කියවීමේ මාසය
ඔක්තෝබර් 2012
සමරු කලාපය

උපදේශක මණ්ඩලය

මහාචාර්ය සෝමරත්න බාලසූරිය - සභාපති
එන්. එච්. එම්. චිත්‍රානන්ද - අධ්‍යක්ෂ ජනරාල්

උපදේශක සංස්කාරක

මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර

සංස්කාරක මණ්ඩලය

නාලිනි මල්ලවආරච්චි - අධ්‍යක්ෂ
ඩබ්ලිව්. සුනිල් - නියෝජ්‍ය අධ්‍යක්ෂ
මෛත්‍රී ජයසුන්දර - සහකාර අධ්‍යක්ෂ

සමරු කලාපය සම්පාදන කමිටුව

ශ්‍රීමා සූරිය බණ්ඩාර
කුසුම් ඒකනායක
ප්‍රියංගා බණ්ඩාර
ඉන්දික නිශාන්ත

178202 P2
14 DEC 2012
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම

චමින්ද හිමේෂ් ද සිල්වා
මානෙල් චාන්දනි
යසිතා නිරූපමා
අශෝකා නිල්මිණි
අරුණි නදීකා

සම්පාදනය

ව්‍යාප්ති සේවා අංශය
ප්‍රකාශන අංශය

ISBN 978 – 955 – 8383 – 80 - 3

ප්‍රකාශනය: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන – 0112698847 ෆැක්ස් - 0112685201 Web - www.natlib.lk

පිටකවර නිර්මාණය - ප්‍රේම් දිසානායක

මුද්‍රණය - ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.
දුරකථන: 0112682223, 0115844392 ෆැක්ස්: 0112682224

# පටුන


- සභාපතිතුමාගේ පණිවුඩය 04
- අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය 05
- ජාතික කියවීමේ මාසය 2012 හැඳින්වීම 06
- ජාතික කියවීමේ මාසය 2012 ප්‍රධාන වැඩසටහන් 07
- කියවීමේ කුසලතා ප්‍රවර්ධනය පිණිස පුස්තකාල සේවාව සතු කාර්යභාරය හා වගකීම: දේශීය සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි. 09
  **ආර්.ඩී. ආනන්ද තිස්ස**
- The Challenges Facing Librarians in the Preservation of Library Materials and Possible Solutions. 25
  **Dr. K. D. G. Wimalaratne**
- විද්‍යුත් මාධ්‍යය හමුවේ නොසැලෙන 'පොත' 30
  **චන්ද්‍රිකා තිලකරත්න**
- பரிபூரணமான சமுதாயத்தை கட்டியெழுப்புவதற்கான தேசிய வாசிப்பு மாதம் 34
  **திருமதி ரீ சிறீதரன்**
- Developing Lifetime Reading Habits in Sri Lankan Context... 41
  **H. M. Gunaratne Banda**
- ජාතික කියවීමේ මාසය 2011 සම්මාන ලාභී පුස්තකාල 47

කියවීම, තොරතුරු ගවේෂණය, පිරිපුන් සමාජයක මූලික ලක්ෂණයකි. එමඟින් බහුශ්‍රැත සමාජයක් හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැංවීම සඳහා ප්‍රජාව උනන්දු කිරීමේ අරමුණින් යුතුව 'කියවීම තුළින් බුද්ධිමත් හා සමෘද්ධිමත් සමාජයක් ගොඩනඟමු' යන තේමාව යටතේ මෙවර ජාතික කියවීමේ මාසය සැමරේ.

පොත පත කියවීම ඇසුරින් දැනුමෙන් සපිරි පුද්ගලයන් බිහිකිරීම පමණක් නොව යහපත් පුරවැසියෙකු වශයෙන් සමාජයට වැඩදායක ලෙස ජීවත්වීමට ද මඟ පෙන්වයි. රටක සාක්ෂරතාව ඉහළ නැංවීමට නම් කියවීමට සමාජය හුරු කළ යුතුය. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ බිහිවන්නා වූ දැනුම අත්පත් කර ගන්නා මාර්ගය කියවීමයි. එම දැනුම සාර්ථක ජීවිතයක් ගත කිරීමට හා පොදු වශයෙන් ජාතික සංවර්ධනය සඳහා යොදා ගැනීම යුගයේ අවශ්‍යතාවක් වේ.

කියවීම් ක්‍රියාවලියේ න්‍යෂ්ටිය පුස්තකාලයයි. පුස්තකාලය කේන්ද්‍ර කොට ගෙන කියවීමේ ක්‍රියාවලිය සක්‍රීය කරවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු අතර, ඒ සඳහා පුස්තකාලයාධිකාරීන්ට මහත් වගකීමක් පැවරී ඇත. මේ සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟ පෙන්වීමට සූදානම්ව සිටී.

ජාතික කියවීමේ මාසය තුළ පාඨකයන්ගේ කියවීමේ රුචිකත්වය ඉහළ නැංවීමට දිවයින පුරා විසිරී තිබෙන පුස්තකාල ඉටු කරනු ලබන සේවය මණ්ඩලය අගය කරන අතර, මෙවර ද එම මෙහෙය වෙනුවෙන් ආයතන 81ක් සඳහා කුසලාන, සහතික හා තිළිණ පිරිනමනු ලැබේ.

**මහාචාර්ය සෝමරත්න බාලසූරිය**
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

සෑම වසරකම ජාතික කියවීමේ මාසය ලෙස ඔක්තෝබර් මාසය නම් කර ඇත. මෙම වැඩසටහන 9 වන වරටත් 2012 වසරේ ඔක්තෝබර් මාසය තුළ කියවීම තුළින් 'බුද්ධිමත් හා සමෘද්ධිමත් සමාජයක් ගොඩ නගමු' යන අරමුණින් ක්‍රියාත්මක කෙරේ.

දැනුම සහ තොරතුරු වර්තමාන ලෝකයේ සෑම ක්ෂේත්‍රයකම වැදගත් මෙන්ම තීරණාත්මක සාධක බව අවිවාදයෙන් පිළිගෙන ඇති කරුණකි. විඥාපන හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රවල වර්ධනය හේතුවෙන් මෙන්ම අපගේ සාම්ප්‍රදායික දැනුම පිළිබඳ ගවේෂණ ද හේතුවෙන් අතිවිශාල දැනුම් හා තොරතුරු සම්භාරයක් අප සතුව ඇත. කියවීමෙන් ආකල්ප දක්ෂතා සහ දැනුම වර්ධනය වේ. දැනුම, තොරතුරු, රසවින්දනය සහ ඉගෙනීම ආදී වශයෙන් කියවීමේ පරමාර්ථ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වුව ද ඒ කුමන අපේක්ෂා යටතේ වුවත් කියවීම පුද්ගල සංවර්ධනයටත්, ඒ තුළින් සමාජ සංවර්ධනයටත් ඇති කරන්නේ ධනාත්මක බලපෑමකි.

සංවර්ධනය වන රටක් ලෙස මෙන්ම ඉදිරියට ගමන් කරන ජාතියක් වශයෙන් අප කියවීම ප්‍රවර්ධනය කිරීමට නව ක්‍රියාමාර්ග වෙත ගමන් කිරීමට කාලය එළැඹී තිබේ. ඒ සඳහා පාඨක ප්‍රජාවට නුදුරු අනාගතයේ දී Digital Electronic මගින් පොතපත කියවීමට අවස්ථාව ලබා දීමත් නව තොරතුරු නිවැරැදි ආකාරයට ලබා දීමත් තුළින් ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කරලීම පුස්තකාල පද්ධතියේ මූලික වගකීමකි.

විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ජාතික කියවීමේ මාසයේ අරමුණු ඉටුකර ගැනීමට දායක වූ සැමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රණාමය පුද කරමි.

**එච්. එන්. එම්. චිත්‍රානන්ද**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික කියවීමේ මාසය - 2012

සාහිත්‍ය ලේඛන කලාව පිළිබඳව සමාජය තුළ පුළුල් කතිකාවතක් ඇති වන සැප්තැම්බර් මාසයට පසු එළැඹෙන ඔක්තෝබර් මාසය 2004 වර්ෂයේ සිට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ඉල්ලීම අනුව රජය විසින් 'ජාතික කියවීමේ මාසය' ලෙස නම් කරන ලදි. සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය මඟින් ද ජනතාව තුළ පොත පත පිළිබඳ ඇල්ම වැඩි කිරීමට ගන්නා උත්සාහයට සමගාමීව කියවීමේ මාසයක් නම් කර, රට තුළ කියවීමට හුරුපුරුදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත්ය. නොයෙකුත් බලවේග විසින් ජනතාව හරසුන් වැඩසටහන්වලට පොළඹවන වර්තමානයේ ජනතාව කියවීමට හුරුකරවීම අන් කවරදාටවත් වඩා ඉස්මතුව පැවතීම. මෙහි අගය තවත් වැඩිවීමට හේතු වී තිබේ.

මෙම තත්ත්වය මැනවින් තේරුම්ගත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2004 වර්ෂයේ සිට (කියවීම් ප්‍රවර්ධන) විවිධ වැඩසටහන් සංවිධානය කර ඇත. මේ සඳහා මණ්ඩලයේ මඟ පෙන්වීම මත දිවයින පුරා පිහිටි මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, කාර්මික විද්‍යාල පුස්තකාල හා සංස්කෘතික මධ්‍යස්ථාන හැකි උපරිම ආකාරයට දායකත්වය සපයයි. ඒ බව ප්‍රාදේශීයව කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර මණ්ඩලය වෙත එවනු ලබන වාර්තාවලින් අවබෝධ කර ගත හැකිය. දශක තුනක යුද්ධමය පරිසරයක ජීවත් වූ උතුරු නැගෙනහිර පළාත්වල ජනතාවගේ කියවීමේ රුචිය ඉහළ නැංවීමට එම පළාත්වල පුස්තකාල දක්වන උනන්දුව ද අතිශයින් පැසසුම් සහගතය. 2011 වර්ෂයේ එම පළාත්වල පුස්තකාල ප්‍රජාවගේ කියවීමේ රුචිය වැඩි දියුණු කිරීමට සිදු කරන ලද වැඩසටහන් රාශියක තොරතුරු අප වෙත එවා ඇත. එම පුස්තකාල ඇතුළු පොදුවේ සාර්ථක වැඩසටහන් ක්‍රියාත්මක කළ පුස්තකාල අසූ එකක් සඳහා මෙවර ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී සම්මාන සහ තිළිණ පිරිනැමීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරමින් සිටි. මීට අමතරව පුස්තකාල 360කට පමණ සහතිකපත් පිරිනමනු ලැබේ.

ජාතික කියවීමේ මාසය සැමරීම පිණිස 2012 වර්ෂයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් කියවීමේ කඳවුරු සංවිධානය, ජාතික පුස්තකාල සාමාජිකත්වය නොමිලේ පිරිනැමීම, ලේඛක පාඨක සුහද හමු සංවිධානය, පාසල් සිසුන් සඳහා ජාතික පුස්තකාලය නැරඹීමේ චාරිකා සංවිධානය කිරීම, පොත් පරිත්‍යාග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි කටයුතු රාශියක් ක්‍රියාත්මක කෙරේ.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නායකත්වය සපයන සභාපති මහාචාර්ය සෝමරත්න බාලසූරිය මහතා, අධ්‍යක්ෂ ජනරාල් එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයටත් මෙම කාර්යය සඳහා උපදේශකත්වය සැපයූ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාට, අධ්‍යක්ෂවරුන්ට, ව්‍යාප්ති සේවා අංශයේ කාර්යමණ්ඩලය ඇතුළු මණ්ඩලයේ සියලු කාර්යමණ්ඩලයට ස්තුතිය පුදකර සිටිමි.

**මෛත්‍රී ජයසුන්දර**
අංශ ප්‍රධාන
ව්‍යාප්ති සේවා

# ජාතික කියවීමේ මාසයේ ප්‍රධාන වැඩසටහන් - 2012

- ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවය 2012.10.31 දින පෙ.ව. 10.00ට ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වීම.
- යාපනය පලෙයි ප්‍රදේශයේ පාසල් තුනක ළමයින් 75ක් සහභාගිත්වයෙන් දින 02ක කියවීම් කඳවුරක් පැවැත්වීම හා පොත් කට්ටල 9ක් පරිත්‍යාග කිරීම. (දෙමළ මාධ්‍ය) (2012.07.30/31)
- පළාත් පාලන අමාත්‍යාංශය හරහා සියලුම පළාත්වල මහජන පුස්තකාල වෙත කියවීමේ මාසයේ වැඩසටහන් පිළිබඳ චක්‍රලේඛ යැවීම.
- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හරහා පාසල් වෙනුවෙන් සකස් කළ චක්‍රලේඛ යැවීම.
- 2011 වැඩසටහන් පවත්වා ඒවායේ වාර්තා යොමු කළ මහජන හා පාසල් පුස්තකාල 81ක් සඳහා සම්මාන ලබා දීම.
- 2011 වැඩසටහන් පිළිබඳව වාර්තා එවූ පාසල් හා මහජන පුස්තකාල 360ක් සඳහා සහතිකපත් ලබා දීම.
- 2011 වැඩසටහන් ඉටුකළ පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලයාධිපතිවරු සඳහා දෙදින සම්මන්ත්‍රණයක් පැවැත්වීම, පොත් කට්ටල 36 පරිත්‍යාග කිරීම. (2012-08-29/30)
- ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සමඟ එක්ව මොනරාගල මහජන පුස්තකාල පාඨක සමාජ සාමාජිකයන් සඳහා දෙදින කියවීම් කඳවුර (සිංහල මාධ්‍ය) (2012-09-15)
- පාඨකයන් 10,000ක් සඳහා ජාතික පුස්තකාල සාමාජිකත්වය නොමිලේ පිරිනැමීම.
- පාසල් සිසුන් / ආචාර්ය මණ්ඩලය සඳහා ජාතික පුස්තකාලය නැරඹීමේ සංචාර සංවිධානය.
- ජාතික කියවීමේ මාසයට අදාළව සමරු කලාපය පළ කිරීම.
- ජාතික කියවීමේ මාසයේ කියවීම ප්‍රවර්ධන වැඩසටහන් මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීම.
- බැනර්, ස්ටිකර්, පොත් සලකුණු හා වෙනත් ප්‍රචාරක මාධ්‍ය මඟින් කියවීම් ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- මහජන පුස්තකාල 1200ක්, පාසල් පුස්තකාල 600ක්, සංස්කෘතික මධ්‍යස්ථාන 240ක් කියවීමේ මාසය වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම.
- ලේඛක පාඨක සුහද හමු 04ක් මණ්ඩලයීය පරිශ්‍රයේ දී සංවිධානය කිරීම.
- ජාතික පුස්තකාලයේ නම සඳහන් සමරු සිහිවටන සකස් කිරීම.(ටී ෂර්ට්, කැප්, ඔර්ලෝසු, මග්, පෑන් රඳවන)
- මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය සහ ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය හා එක්ව සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂා මාධ්‍යයෙන් රචනා තරගයක් පැවැත්වීම.

# කියවීමේ කුසලතා ප්‍රවර්ධනය පිණිස පුස්තකාල සේවාව සතු කාර්යභාරය හා වගකීම : දේශීය සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි


ආර්.ඩී. ආනන්ද තිස්ස
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.



## සාරාංශය

දේශීය සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය හෙවත් ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායයේ සම්භවය හා විකාශය මෙන්ම එමඟින් වර්තමාන අධ්‍යාපන ක්‍රමයට ගත හැකි ආදර්ශ විමර්ශනය කිරීම කාලීන අවශ්‍යතාවකි. එකී පෞරාණික අධ්‍යාපන ක්‍රමය ශීල, සමාධි හා ප්‍රඥා යන පරමාර්ථ මුදුන් පත් කර ගැනීම පිණිස බෞද්ධාචාර්යයන් වහන්සේලා විසින් එහි උත්තරීතර ගුණාංගයන් වූ වනපොත්කරණය, සජ්ඣායනය, සම්මන්ත්‍රණය, දේශනය හා සම්භාෂණය යන සංලක්ෂණ ප්‍රයෝජනයට ගන්නා ලදි. මෙම ලිපියෙන් කියවීමේ කුසලතා වර්ධනයට බලපෑ දේශීය අධ්‍යාපන සම්ප්‍රදාය මඟින් නිර්මාණාත්මක චින්තනයෙහි ඇති වැදගත්කම පිළිබඳ නවමු ආකාරයේ ආකල්පමය වෙනසක් ඇතිකිරීමට උපස්ථම්භක වන කරුණු විමර්ශනාත්මකව අධ්‍යයනය කර ඇත.


## හැඳින්වීම

වර්තමානයේ දැනුම පාදක සමාජයක් (Knowledge based society) නිර්මාණය වී ඇත. නූතන ඉලෙක්ට්‍රොනික සමාජ වටපිටාවක වුව ද මිනිසා වෙත දැනුම ලබා ගැනීමේ ප්‍රධානතම මාධ්‍ය ලෙසින් විරාජමානව සිටීමට පොත පතට හැකියාව

ලැබීම ඊට අනන්‍ය වූ නෛසර්ගික ප්‍රබලත්වයට මහගු නිදසුනකි. විශේෂයෙන් අද්‍යතන සමාජය වෙතින් කියවීමේ පුරුදු බැහැර වීම යනු අනාගත සමාජයේ ස්වරූපය පිළිබඳ ව කරනු ලබන බියජනක ඉඟියකි.

අධ්‍යාපනය යනුවෙන් විද්‍යා ශාස්ත්‍ර ඉගැන්වීම, පුහුණු කරවීම, සිප්සත හැදෑරීම හා හැදෑරවීම අර්ථවත් වන්නේ ය. ආර්. එස්. පීටර්ස්ට අනුව 'අධ්‍යාපනය' යන වචනය 'කිසියම් ක්‍රියාවලියක ප්‍රාප්තියක්' වශයෙන් අර්ථ නිරූපණය කර ඇත. මිනිසා නියුතු වන ප්‍රාප්තියකට පත්වන හැම කාර්යයක් ම අධ්‍යාපන වටිනාකමක් තිබිය නොහැකි ය. අධ්‍යාපනය මිනිස් වර්ගයා ඔපමට්ටම් කරන කාරකයක් සේ සලකන විට සදාචාරාත්මක හැඟීම් හා අත්වැල් බැඳ ගමන් කරන ක්‍රියාවලියක්, අධ්‍යාපනමය වටිනාකමක් ඇති ක්‍රියාවලියක් ලෙස සැලකීමට බාධාවක් නැත. (පඤ්ඤාලෝක හිමි, 2002. පි. 15)

බෞද්ධ අධ්‍යාපන ක්‍රමය හෙවත් දේශීය අධ්‍යාපන සම්ප්‍රදාය වනාහි ඉගෙනුම, දැනුම ලබාදීම හා ශිල්ප හැදෑරවීමටත් වඩා බුද්ධි පරිපාකය මඟින් විශිෂ්ට ධර්මඥානය ලබා ගැනීමත් ආධ්‍යාත්මික ගුණවගාවත් මෙන්ම ශීල, සමාධි හා ප්‍රඥා උපදවා ගැනීමේ පරමාර්ථ සහිත සංස්කෘතික අධ්‍යයනයක් වශයෙන් අර්ථ නිරූපණය කළ හැකි ය. බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයෙන් දැනුම, අවබෝධය හා කුසලතා වර්ධනයත් සමඟම ශිල්ප හා ශාස්ත්‍රීය ඥානය ලබා දෙන අතර ම නිර්මාණාත්මක කෞශල්‍යය, කියවීමේ කුසලතා හා නිදහස් චින්තනය පුබුදු කරමින් ප්‍රඥා පාටවය (ප්‍රඥාව පිළිබඳ දක්ෂභාවය) පිණිස හේතු වන්නේ ය.

පොත ගැන ඇති ක්වෝට්ස්ගේ නිර්වචනයෙන් ම පොත පතෙහි අපූර්වත්වය හා විශිෂ්ටත්වය මැනවින් ප්‍රකට කෙරේ. "පොත් යනු ශිෂ්ටාචාරය ඉදිරියට ගෙන යනු ලබන වාහකයන් වේ. පොත් නැති තැන ඉතිහාසය නිශ්ශබ්ද වෙනු ඇත. සාහිත්‍යය ගොළු වෙනු ඇත. විද්‍යාව කොරකු නැත්නම් අබ්බගාතයකු හෝ තත්ත්වයට පත් වෙනු ඇත. සිතීම සහ අනුමානයන් (කල්පනාවන්) එක තැන ලොප් වෙනු ඇත." (Books are carriers of civilization. Without books, history is silent, literature dumb, science crippled, thought and speculation at standstill. - Barbara W. Tuchman Quotes 1912-1989)

## දේශීය අධ්‍යාපන සම්ප්‍රදාය

දේශීය අධ්‍යාපන සම්ප්‍රදාය ගුරුවරයා මුල් කොට ගෙන පැවැතුණකි. ගුරුවරයා අනුගමනය කිරීම සිසුන්ගේ සිරිත විය. අතීතයේ පෙරදිග අධ්‍යාපනයයේ නිරතවූවෝ බමුණු පඬිවරු වූහ. බුදුසසුන මෙහි පැමිණීමෙන් පසු බමුණන් අත පැවැති අධ්‍යාපනය භික්ෂූන් අතට පත්විය. එය දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයේ ගමන් මාර්ගය විප්ලවීය වෙනසකට ලක්වීමකි. රටට අවශ්‍ය, දේශයට උචිත, ජාතිය

පණගන්වන, දේශාලයෙන් පිරිපුන්, ආගම භක්තිය ඇති ජාතියක් බිහිකිරීමේ හැකියාව එමගින් නො අඩුව ලැබුණි. බාහිර ඔපයට වඩා සැබෑ යථාර්ථය පෙන්වා දීම දේශීය අධ්‍යාපන ක්‍රමයේ අංගයකි. ඔවුන්ගේ දැනුම රටට බරක් නො වී ය. පොත පත පරිශීලනය හා වනපොත් කිරීම පෙරදිග අධ්‍යාපන සම්ප්‍රදායටම ආවේණික ලක්ෂණයකි. කියවීමේ රුචිය වර්ධනය කොට කියවීමේ කුසලතා ප්‍රගුණ කිරීම පිණිස දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයෙන් ගත හැකි ආදර්ශ බොහෝ ය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව පැවැත් වූ ප්‍රථම ධර්ම සංගායනාවෙන් අනතුරුව බුද්ධ භාෂිතය නොහොත් බුද්ධ වචනය වනපොත් කොට (කටපාඩම් කිරීම) දේශනා කිරීම සඳහා භාණකවරුන් පත්කර ඒවායේ භාරකාරිත්වය පවරන ලදි. එක් එක් පිටකය නැවත උපබෙදුම්වලට වර්ග කර එකී උපබෙදුම ඒ ඒ භාණක පරම්පරාවලට ද පවරනු ලැබී ය. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ජීවත් වූ දීඝ භාණකයන් හා මජ්ඣිම භාණකයන් පිළිබඳ තොරතුරු අට්ඨ කථාවල සඳහන් වේ. කැලණි විහාරයෙහි වැඩ සිටි තරුණ දීඝ භාණක භික්ෂුවක් පිළිබඳ ව අපදානට්ඨ කථාවෙහි සඳහන් කර ඇති අතර, දීඝ භාණක අභය නම් භික්ෂුවක් කැලණියෙහි වැඩ සිටි බව ද වැඩිදුරටත් දක්වා ඇත. දීඝ භාණක තෙරවරුන් පිරිසක් මහාසුදස්සන සූත්‍රය සජ්ඣායනා කළ අවස්ථාවක වසභ රජතුමා (ක්‍රි. ව. 127-171) ධර්මය අසා සතුටට පත් වූ ආකාරය සුමඞ්ගලවිලාසිනියෙහි (අදිකාරම්, 2003. පි. 75) සඳහන් වී ඇත. මෙම භාණක සම්ප්‍රදාය පුස්තකාල සම්ප්‍රදායයේ හා දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයේ මුඛ්‍ය ලක්ෂණ වන බව සඳහන් කළ හැකි ය.

දේශීය බෞද්ධ අධ්‍යාපනයෙහි පරමාර්ථ ඉදිරිපත් කරමින් මහාචාර්ය එල්. ජී. හේවගේ (ජයවීර, 1996. පි. 20) මෙසේ සඳහන් කරයි.

(අ). තමන්ට ද, සමාජයට ද යහපතක් වන පරිදි දැනුම, ආකල්ප හා කුසලතා ලබා දීම.

(ආ). නෛසර්ගික දැනුම පෞරුෂ සංවර්ධනය පිණිස යොදා ගැනීම.

(ඇ). තමන් හා පරිසරය පිළිබඳ යථාතත්ත්වය අවබෝධ කර ගැනීමට අවස්ථා සැලසීම.

(ඈ). මානව චර්යා රටාව මානව සමාජයේ යහපත පිණිස භාවිත කිරීම.

මේ අනුව දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයෙහි අරමුණ පුද්ගල හා සමාජ සංවර්ධනය බව නිගමනය කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ දේශීය අධ්‍යාපනය ආරම්භක අවධිවල සිට අධ්‍යයනය කිරීම පහසු ය. යටත් විජිත යුගයේ ආරම්භයේ සිට ක්‍රිස්තු වර්ෂ 1815 මාර්තු 02 වන දින

උඩරට ගිවිසුම අත්සන් කරන තෙක් කාල සීමාවෙහි දේශීය අධ්‍යාපනය මෙරට පාලනය කළ විදේශීය පාලකයන්ගේ අවශ්‍යතා අනුව සකස් කරන ලද්දකි. ක්‍රි. ව. 1815 සිට 1948 පෙරවාරි 04 වන දා තෙක් ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ ගෙවී ගිය වසර 133ක කාලය දේශීය අධ්‍යාපන ක්‍රමය සැලකිය යුතු පරිවර්තනයකට ලක් වූ කාල සීමාවකි. දේශීය අධ්‍යාපන සම්ප්‍රදායෙහි සංවිධාන ව්‍යුහය ස්වරූප දෙකක් යටතේ සාකච්ඡා කළ හැකි ය.

## ප්‍රාග් මහින්ද යුගයේ පැවැති ගුරු ගෙදර අධ්‍යාපන ක්‍රමය

ප්‍රාග් මහින්ද යුගයේ පැවැති ගුරු ගෙදර අධ්‍යාපන ක්‍රමය බ්‍රාහ්මණයන් හා ශිල්පඥයන් විසින් ලබා දෙන ලද්දකි. මෙරට සිටි විවිධ ජන කොටස් අධ්‍යයන කටයුතුවල නියුක්ත පිරිස් බවට තොරතුරු ඓතිහාසික මූලාශ්‍රවල හා වංශකතාවල සඳහන් වේ. කුවේණිය විජයට හමු වූ අවස්ථාවේ දී ඇය කිසියම් කර්මාන්තයක නියැළී සිටි බවට තොරතුරු සඳහන් වන අතර, ඇය වෙරළේ මුතු මැණික් ආදිය තබා අලෙවි කළ බවත්, ඒවායේ මිල ගණන් සටහන් කර තිබූ බවත් කියැවේ. මේ ඓතිහාසික කරුණු අනුව මෙරට පැවැති අධ්‍යාපන ක්‍රමයේ විශිෂ්ටත්වය පිළිබිඹු වේ.

ප්‍රාග් මහින්ද යුගයේ පැවැති ගුරු ගෙදර අධ්‍යාපන ක්‍රමය ගිහි විනය සම්බන්ධයෙන් වැදගත් කරුණු රාශියක් සඳහන් වන සිඟාලෝවාද සූත්‍රය ඇසුරෙන් විග්‍රහ කළ හැකි ය. නූතන අධ්‍යාපන චින්තනය විසින් සොයා ගන්නා ලදැයි පුරසාරම් නඟන දැනුම, ආකල්ප හා කුසලතාවලින් පිරිපුන් අධ්‍යාපන ක්‍රමයක් දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයේ හා බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායයේ පදනම විය. බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ දී මවුපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් පහක් සඳහන් කර ප්‍රථමයෙන් දරුවා ශිල්පීය අධ්‍යාපනයට යොමු කළ යුතු බව දේශනා කළ සේක. සාරධර්ම අධ්‍යාපනයේ ඇති වටිනාකම එයින් විස්තර කෙරේ. ඒවා නම්

(අ). පාපා නිවාරෙන්ති - පවින් වැළැක්වීම (ආකල්ප)

(ආ). කල්‍යාණේ නිවෙසන්ති - යහපතෙහි යෙදවීම (කුසලතා)

(ඇ). සිප්පං සික්ඛාපෙන්ති - ශිල්ප ඉගැන්වීම (දැනුම)

දේශීය අධ්‍යාපනයේ ශක්තිමත් පදනම මේ අනුව මොනවට පැහැදිලි වේ. වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන් බටහිර රටවල අසාර්ථක වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මෙරට ක්‍රියාත්මක කිරීමට පෙර, අපේ උරුමය හෙවත් පෙරදිග සම්ප්‍රදාය ගැන අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවක් බව විශේෂයෙන් සඳහන් කළ යුතු ව ඇත.

## මහින්දාගමනයෙන් පසු අධ්‍යාපන ක්‍රමය

බුදු දහම මඟින් ඉදිරිපත් කරන ලද ශීල, සමාධි හා ප්‍රඥා යන ත්‍රිශික්ෂාව පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය පසුකාලයේදී ශාස්ත්‍රීය අංශය ග්‍රන්ථ ධුරය හා භාවනාමය අංශය විදර්ශනා ධුරය වශයෙන් දෙයාකාරයකින් භික්ෂූන් වහන්සේලා අතර ප්‍රචලිත විය. මහින්දාගමනයෙන් පසු මෙරට පැවැති අධ්‍යාපන ක්‍රමය ප්‍රධාන ආයතන තුනක් කේන්ද්‍ර කර ගෙන විකාශනය වී ඇත.

| ආයතන | අධ්‍යාපනයේ මට්ටම | ගුරුවරු |
|---|---|---|
| (අ). ආරාමය/විහාරය/පන්සල | මූලික අධ්‍යාපනය | භික්ෂූන් වහන්සේලා හා බහුශ්‍රැත ගිහි පණ්ඩිත පිරිස |
| (ආ). පිරිවෙන/පරිවෙන | ද්විතීයික අධ්‍යාපනය | |
| (ඇ). මහ පිරිවෙන/මහා විහාරය | තෘතීයික අධ්‍යාපනය | |

මේ ආයතනවල විවිධ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරන ලද අතර, වනපොත්කරණය ඒ අතරින් ප්‍රමුඛතම කාර්යය වශයෙන් සලකා ඇත. ඊට අමතරව ක්‍රියාවෙන් අවබෝධය, සජ්ඣායනය, සම්මන්ත්‍රණ, දේශන හා සංවාද ආදී වශයෙන් පුද්ගල හා සමූහ ඉගැන්වීමේ ක්‍රම පැවැතුණි.

කියවීමේ කුසලතා වර්ධනයට ඉගැන්වීමේ උපකරණ භාවිත කර ඇත. වැලිපිලෙහි අකුරු ලිවීම පුහුණු වීමෙන් පසු ශිෂ්‍යයා පත්හිදෙන් ලිවීමට පුරුදු වෙයි.

සෝඩිය ද ගෙන' තිනේ - කියා සිත් ලෙස ඇනේ
පිල්ලම් ද කියමිනේ - වැල්ලේ ද ලියමිනේ
නම්ගමුත් කියමිනේ - සැහැලි පොත්කියමිනේ
වදන් කවි කියමිනේ - බුද්ධගජ්ජය ඇනේ (වදන් කවි පොත)

නිර්දේශිත ග්‍රන්ථ භාවිතය ඉතා විශිෂ්ට මට්ටමක පැවැතිණ. මූලික අධ්‍යාපන ග්‍රන්ථ වූ වදන් කවි පොත, ගණදෙවි හෑල්ල, සකස්කඩ, බුද්ධගජ්ජය වැනි කෘති පරිහරණයෙන් කියවීමේ කුසලතා වර්ධනය පිණිසත් ස්මෘති ශක්තිය වැඩිදියුණුව පිණිසත් ලැබුණු පිටිවහල විශිෂ්ටය. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කෘතිවල පශ්චාත් අධ්‍යාපන ක්‍රම හා අධ්‍යයන උපකරණ භාවිතය ගැන සඳහන් වේ. එම අධ්‍යාපන සම්ප්‍රදායයේ අපූර්වත්වය සමඟ සංසන්දනය කළ හැකි හෝ ඒ ආසන්නයට ගැනෙන හෝ විධිමත් අධ්‍යාපන ක්‍රමයක් බටහිර අධ්‍යාපන ක්‍රමයෙහි දක්නට නොහැකිය.

දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයේ ගුරු ගෙදර වේවැල යොදා ගෙන ඇත්තේ දුරාතීතයේ සිට ය. 'වේවැල බැහැර කරමින් දරුවා යහමඟට ගැනීම අපහසු ය'

යන කරුණ එවක අධ්‍යාපනයේ පිළිගත් සම්ප්‍රදායයක් විය. වර්තමානයේ පවා ලංකාවේ බොහෝ පාසල්වල වේවැල පාසලේ අවශ්‍ය උපකරණ අතරට ගැනෙන්නකි. “නො තළා හදන දරුවාත්, හැඳි නො ගා උයන කැඳත් වැදගැම්මකට නෑ” (Seneverathna, 2005. p.13) ගුරු භූමිකාවෙහි අගය, දඬුවමෙහි අවශ්‍යතාව හා සිප්සත ඉගෙනීමෙහි වටිනාකම ‘සිරිත් මල්දම’ නමැති උපදේශ කාව්‍යයෙහි පද්‍යයෙන් මනාව චිත්‍රණය කර ඇති බව පහත දැක්වෙන නිදසුන්වලින් පෙන්නුම් කෙරේ.

‘ගුරු බස සැබෑ ම ය - එය පිළිගැනුම යුතුම ය
පඬි බසත් එය ම ය - එයින් දෙලොවෙහි මහත් සැපම ය’

‘ගුරුවරු කිසි ම විට - සතුටු නො ම වෙති තැළුමට
හොඳින් එය සිහි කොට - වැරදි නො කරන් තැළුම් කෑමට’
(සිරිත් මල්දම)

‘... දඬුවම් නො දුන්නොත් - ළමයි කිසි කල හොඳින් නො හැදෙත් ’
(ද සිල්වා, 2009. පි. 9)

යනුවෙන් දඬුවමේ අවශ්‍යතාව ද සිරිත් මල්දමෙහි පෙන්වා දී ඇත.

එහෙත්, නූතන අධ්‍යාපන ක්‍රමය හෙවත් නිදහසින් පසු ආරම්භ වූ අධ්‍යාපන ක්‍රමයෙන් වේවැලට ප්‍රමුඛස්ථානයක් ලැබී නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් චරිත සංවර්ධනය අධ්‍යාපන ක්‍රමය තුළ විශාල සංවාදයකට ලක් වී ඇත. එහෙයින් ‘විද්‍යා දදාති විනයං’ යන පාඨයෙන් ‘ඉගෙනීමෙන් හික්මීම හා විනය ඇතිවන්නේ ය’ යන පැරණි සමාජ පිළිගැනීම කිසිදු හරයක් නැති ප්‍රලාපයක් බවට පත් වී ඇත. දේශීය අධ්‍යාපන සම්ප්‍රදායය පිරිහීම සඳහා බලපාන ලද කරුණු කීපයක් පහත සඳහන් වේ.

(අ). භික්ෂූන් වහන්සේ සතු ව පැවැති අධ්‍යාපන ක්‍රමය ඉංග්‍රීසි පාලනයත් සමඟ ම වෙනස් වීම

(ආ). ක්‍රිස්තු ලබ්ධියට අයත් නිකාය කීපයක් මඟින් මේ රටේ අධ්‍යාපනය සිය පාලනයට නතු කර ගැනීම

(ඇ). මිෂනාරි අධ්‍යාපනය මඟින් පිහිටුවන ලද පාසල්වලට බඳවා ගත් බෞද්ධ හා හින්දු දරුවන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම

(ඈ) මිෂනාරි අධ්‍යාපනය නිසා ශාරීරික ව පමණක් ලාංකික වූ ද, චින්තනයෙන් හා චර්යාවෙන් බ්‍රිතාන්‍ය වූ ද කළුසුද්දන් පිරිසක් බිහිවීම

(ඉ). දේශීයත්වය වෙනුවට ඉංග්‍රීසි භාෂාව, බටහිර හැදියාව හා ඉංග්‍රීසි සිප් ලකුව ආරෝපණය කිරීම

## නිදහසින් පසු අධ්‍යාපන සම්ප්‍රදායය

බ්‍රිතාන්‍ය පාලනයට යටත් ව අවුරුදු 133ක කාලයට (1815-1948) පසු ව ලංකාවේ අධ්‍යාපනයට දේශීය මුහුණුවරක් ලැබිණි. වර්ෂ 1961 - 1972 අතර තුර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කීපයක් ම සිදුවුණ ද, තවමත් විද්‍යමාන වන්නේ ශ්‍රී ලංකාවට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයකැයි නොකිවහැකි ය. දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයේ ස්වභාවය හෙවත් පදනම නිර්මාණය වූයේ 'වදන් කවි පොතේ' එන පහත සඳහන් ආදර්ශය යටතේ ය.

"තිබූ තැනක සොර සතුරන් ගත නො     හෙනා
එ සැඩමනාවත් වතුරෙන් වළ නො     හෙනා
කෝප වුවත් රජ මැතිඳුන් ගත නො     හෙනා
උගත මනා ශිල්පය මයි මතු     රැකෙනා"

එහෙත්, නිදහසින් පසු බිහි වූ අධ්‍යාපන සම්ප්‍රදායයෙහි මේ ආදර්ශ පාඨය 'මතු රැකේනා ශිල්පය මයි උගත මනා' වශයෙන් සංශෝධනය වී ඇත. එකී සංශෝධනයෙන් ගම්‍ය වනුයේ අප විසින් කියවිය යුත්තේ විභාග ඉලක්ක කර ගත් පටු විෂය ක්ෂේත්‍රයක් සඳහා පමණක් ද යන්න විමසිය යුත්තකි. කියවීමේ පුරුදු ජන සමාජයට පුරුදු පුහුණු කිරීමේ තිඹිරි ගෙය විය යුත්තේ පාසල බව රහසක් නො වේ.

නිදහසින් පසු අධ්‍යාපනය කිසියම් ආකාරයකින් දේශීය සම්ප්‍රදායයන්හි පැවැති හර පද්ධතිය බැහැර කර, බටහිර අධිපතිවාදී මානසිකත්වය සතුටු කරන ගමන් මාර්ගයකට අවතීර්ණ වී ඇත. ඒ අනුව වර්තමානයේ අධ්‍යාපනයේ අරමුණු පිළිබඳව සමාජ කතිකාවක් නිර්මාණය වී ඇත. අධ්‍යාපනයේ අරමුණු මොනවාද යන්න විමර්ශනයේ දී එහි පැරණි අරමුණු වන යහපත් පුරවැසියන් බිහිකිරීම යන්න සැබෑ වී තිබේ දැයි විමසිය යුතුය. අධ්‍යාපනයේ නූතන අරමුණ සමෝධානිත පෞරුෂය ඇති පුරවැසියන් බිහිකිරීම ය. සමෝධානිත පෞරුෂය යනු (අ). චින්තන කුසලතා, (ආ). පෞරුෂ කුසලතා හා (ඇ). සමාජ කුසලතා වශයෙන් කොටස් තුනක් යටතේ විස්තර කෙරෙයි. නූතන අධ්‍යාපන ක්‍රමයේ දී (අ). උගන්වනු ලබන විෂය, (ආ). ඉගැන්වීම කරන ගුරුවරයා, (ඇ). ඉගෙනුම ලබන ශිෂ්‍යයා යන කරුණු තුන (ජයසේකර, 1997. පි. 108) වැදගත් කොට සලකනු ලැබේ.

School is dead නම් කෘතියේ දී එවරට් රෙයිමර් (Everat Reimer) අධ්‍යාපනය සම්බන්ධයෙන් අදහස් තුනක් ඉදිරිපත් කර ඇත. ඒවා නම්,

(අ) පවතින අධ්‍යාපන ක්‍රමය වැඩක් නැහැ.

(ආ). පවතින අධ්‍යාපන ක්‍රමය අපිට ජය ගත නො හැකි ය. අපේ අනෙක් පරම්පරාවට ජය ගත හැකි ය.

(ඇ). පවතින අධ්‍යාපන ක්‍රමය අපට ජය ගත හැකි ය. ඒ සඳහා අපට අවශ්‍ය වන්නේ කපටිකම, වංචාව හා බොරුව එනම් ප්‍රයෝගය යි.

මේ අනුව නිදහසින් පසු අධ්‍යාපනය ඉතා වේගයෙන් පරිණාමය වෙමින් පවතින බව ප්‍රත්‍යක්ෂ වේ.

පතක් පොතක් කියවීමට මූලික වන්නේ අක්ෂර ඥානය හෙවත් සාක්ෂරතාවයි. (Literacy) එහෙත්, අකුරු කියවීමට හා ලිවීමට ඇති හැකියාව නිසා ම කෙනෙකු ඇල්මකින් පත පොත කියවන බව නො පිළිගත යුතු ය. පොතක් කියවීමට කිසියම් කියවීමේ රුචියක් තිබිය යුතු ය. කියවීමට භාග්‍යය ලැබුවෝ තම ජීවිත පහත සඳහන් කරුණුවලින් පොහොසත් කර ගනිති.

(අ) මනස උසස් සිතුවිලිවලින් පොහොසත් වීම.

(ආ) තෘප්තිමත් ජීවිතයකට මඟ පෑදීම.

(ඇ) උසස් අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට මඟ පාදා ගැනීම.

(ඈ) බහුශ්‍රැත පණ්ඩිවරයකු බවට පත්වීම හා දැනුමින් පරිපූර්ණ වීම.

(ඉ) ලේඛකයකු, ගත්කතුවරයකු හෝ ජනමාධ්‍යවේදියකු වීම.

(ඊ) තම කටයුතු නවතාවෙන් යුතු ව කරන්නකු වීම.

පත පොත කියවීමේ දී ඊළඟ සාධකය වන්නේ දැනුම මට්ටම හෙවත් ඥාන මට්ටමයි. (Level of Knowledge) අලුතින් යමක් කියවීමට, සෙවීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා මුලින් ම කිසියම් දැනුමක් තිබිය යුතු ය. කියවීමේ කුසලතා වර්ධනය කර ගැනීම මෙහි දී වැදගත් සාධකයකි.

## කියවීමේ කුසලතා වර්ධනය කිරීම

කියවීමේ අගය හෙවත් කියවීමේ කුසලතා ගැන විවිධ නිර්වචන ඉතිහාසය පුරාම බිහිවී ඇත. අවධානයට හා සැලකිල්ලට ලක් විය යුතු ආදර්ශ පාඨ කීපයක් පාඨක ප්‍රයෝජනය පිණිස පහත දැක්වේ.

"කියවීම පූර්ණ මිනිසකු තනයි. සාකච්ඡාව අප්‍රමාද මිනිසකු ද, ලිවීම නිවැරැදි මිනිසකු ද තනයි".

ෆ්‍රැන්සිස් බේකන්

"ශරීරයට අභ්‍යාස යම් සේ ද බුද්ධියට කියවීම ද එසේම ය".

**රිචර්ඩ් ස්ටිම් සාමි**

"කෙනකු කියවිය යුත්තේ හුදෙක් ඔහුගේ නැඹුරුව අනුව ය. දුෂ්කර කටයුත්තක් සේ කියවන දෙයින් ඔහුට ප්‍රයෝජනයක් නො සිදු වෙයි".

**සැමුවෙල් ජොන්සන්**

"කෙනෙක් තමාගේ ශික්ෂණයෙහි මහිමය පෙන්වන්නට නිරායාසයෙන් ලියයි. ආයාසයෙන් තොර ව ලියන දේ කියවීම ඉතා ම අපහසු ය".

**ආර්. බී. ෂෙරිඩන්**

''කියවන්න. සටහන් කරන්න. ඉගෙන ගන්න. අභ්‍යන්තර වශයෙන් ජීර්ණය කර ගන්න''.

**පොදු යාච්ඥා පොත**

"කියවීම යනු සමහර විටක දී සිතීම මග හරවන විචක්ෂණ උපක්‍රමයකි".

**ආතර් හෙල්ප්ස් සාමි**

"මම ජීවිතේ අසීරු අවස්ථාවල දී පොත් තුළින් සහනය ලබමි. මම ඒ තුළින් මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ සේයාවක් ද සොයමි".

**ශ්‍රීමත් ආතර් කින්**

කියවීම අනාදිමත් කාලයක සිට පැවත එන මානව ක්‍රියාකාරිත්වයකි. එහෙත්, කියවීම යන වචනයට දෙනු ලබන සිංහල පාරිභාෂික අර්ථ විවිධ ගැටලු ඇති කරයි. අක්ෂර සහ ලේඛනය බිහිවූ දින සිට කියවීමේ පුරුද්ද මානව සමාජයේ අවියෝජනීය අංගයක් බවට පත් වූ බව පැහැදිලි කරුණකි.

## කියවීමේ කුසලතා වර්ධනයට පුස්තකාලය වගවීම හා වගකීම

පත පොත, සඟරා හා පුවත් පත් කියවීමට පුරුදු වීමේ දී සම්මත රීති හතරක් හඳුනා ගත හැකි බව මනෝ විෂයයක වාග් විද්‍යා විශාරදයකු වන පීටර් එඩ්මන්ඩ් පෙන්වා දෙයි. ඒ අනුව,

(අ) යමක් දෙස බලා කියවීමට පුරුදුවීම (නිශ්ශබ්ද කියවීම/ඇසින් කියවීම)

(ආ) ශබ්ද නඟා කියවීමේ ක්‍රමය

(ඇ) භාෂාවක් ඉගෙන ගෙන ඒ අනුව කියවීමේ පුරුද්ද ඇති කර ගැනීම

(ඈ) යම් යම් තැන්වලින් උපුටා ගන්නා ලද කොටස් අනුසාරයෙන් කියවීම

විවිධ අරමුණු හා අවශ්‍යතා අනුව ආරම්භ කර ඇති පුස්තකාල ඉගෙනුම් හා තොරතුරු අවශ්‍යතා සපුරාලීමත්, ඊට අදාළ සම්පත් සැපයීමත් මූලික

අභිමතාර්ථය ඇති ව සංවිධානය කර ඇත. ඒ අනුව කවර සමාජයකට වුව ද පුස්තකාලය නැතිවම බැරි අංගයකි. ශ්‍රී ලාංකික සමාජයේ කියවීමේ කුසලතා වර්ධනයට පුස්තකාලය වගවීම හා වගකීම කෙසේ ද යන්න නව ආකාරයකින් පහත සඳහන් කරුණු ඇසුරෙන් විග්‍රහ කළ හැකි ය.

## චර්යාවන්හි වෙනසක් ඇති කිරීම

පොත පත පරිශීලනයෙන් චර්යාවන්හි වෙනසක් ඇති කළ හැකි ය. අඩු තරමින් දිනපතා පුවත්පතක්වත් කියවන්නේ කීයෙන් කී දෙනා ද? පොත් පත් කියවන සිනමා, නාට්‍යය, නවකතා, කෙටිකතා, චිත්‍ර, මූර්ති, සංගීතය වැනි විදග්ධ කෘති ඇසුරු කරන, සාකච්ඡා හා සම්මන්ත්‍රණවලට සහභාගි වන්නේ අප අතරින් කොපමණ සංඛ්‍යාවක් දැයි බුද්ධිමත් ව විමසා බැලිය යුතු ය.

## නව දැනුම උකහා ගැනීමට අවස්ථාව ලබා දීම

වැඩ කිරීමට නව දැනුම අත්‍යවශ්‍යයි. නව දැනුම අපේ දෛනික අවශ්‍යතා හා බලාපොරොත්තු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගත යුතු ය. එසේ නොවන දැනීමෙන් පලක් නැත. වෛදික අධ්‍යාපන සම්ප්‍රදාය වේදය පදනම් කර ගෙන බිහිවූවකි. 'වේද' යන්නෙහි අර්ථය ඥානය, දැනුම (උතුම් දැනුම) යි. (Veda = Knowledge) වේදි යනු : උගතා, විද්වතා, දැනුවත් පුද්ගලයා, ඉගෙන ගන්නා තැනැත්තා යන අර්ථ දෙයි.

දැනුම යනු ප්‍රවාහයකි. එය නො නවත්වා ගලා යන්නකි. වැඩ කිරීම සඳහා උනන්දුව ඇතිවිට ඒ සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව නැත. අවශ්‍ය පුහුණුව හා දැනුම ඇතිවිට වැඩ කිරීමට උනන්දුවක් නැත. දැනුම ජීවිතවල සාර්ථකත්වයට හේතුවකි. නොදැනීම ජීවිතයේ අසාර්ථකත්වයට හේතුවකි. දැනීම පිළිබඳ ජනවහරක් වශයෙන් "ගෙදර මහ පොතක් ඇත - එකක්වත් මතක නැත කීවා වගෙයි..." යන්න දැක්විය හැකි ය. (You have a big book at home, but you cannot recollect anything.) (Seneverathna, 2005. p.13) දැනුම පොත්වල සඳහන් වූවාට ප්‍රයෝජනයක් නැත. එය නිසි පරිදි භාවිතයට හා වැඩට ගත යුතු ය. ඒ බව මේ ශ්ලෝකයෙන් තවදුරටත් අර්ථවත් වේ.

පුස්ථකශ්වයාච යා විද්‍යා - පරිහස්තේච යද් ධනම්
කාර්ය කාලේ සමායාතේ - නතත් විද්‍යා නතත් ධනම්

ජීවිත සාර්ථකත්වය පිණිසත්, ආරම්භ කරන සෑම කටයුත්තක් ම සපල කර ගැනීම පිණිසත් අරමුණක්/දැක්මක් තිබිය යුතු ය. අභිමතාර්ථ ඉෂ්ට සිද්ධ කර ගැනීම සඳහා (අ). අධිෂ්ඨානය, (ආ). විශ්වාසය හා (ඇ). උනන්දුව යන කරුණු තුන අවශ්‍ය වේ.

## පෙලඹවීම (අභිප්‍රේරණය)

පොත පත කියවීම පිණිස ආශා ඇතිකරවීම, උනන්දු ඇතිකරවීම, යොමු කරවීම හා කැමැත්තක් ඇතිකරවීම මෙයින් අදහස් කෙරේ. බුද්ධාවවාදයට අනුව දැනුම ගවේෂණයෙහි යෙදෙන නුවණැත්තා (විඤ්ඤූ) මොහොතක කාලයක් පණ්ඩිතයකු සෙවුණේ වේ ද, දිව සූපයෙහි රසය වහා දැන ගන්නා පරිද්දෙන් (හේ) ධර්මය වහා අවබෝධ කර ගනියි.

"මුහුත්තමපි චෙ විඤ්ඤූ - පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති - ජිව්හා සූප රසං යථා"
(ධම්මපදය)

මෙම ධම්මපද ගාථාවෙහි අර්ථය අනුව දැනුම ලබා ගැනීම (බහුශ්‍රැත වීම) සඳහා පොත පත පරිශීලනය පිණිස පෙලඹවීමක් ඇතිකර ගත යුතු ය. ඒ සඳහා,

(අ) කියවීමේ රුචිය වර්ධනය කිරීම හා උසස් පොත් පත් කියවීමට ඕනෑකමක් ඇතිකරවීම.

(ආ) නව දැනුම සෙවීමට, (ගවේෂණය කිරීමට) යොමු කරවීම හා පෙලඹවීම (බුද්ධිමය සංවර්ධනය)

(ඇ) උසස් රුචිකත්වය හා රසිකත්වය (රසඥතාව) පුබුදු කරවීම.

(ඈ) විනය හා චරිත සංවර්ධනය ඇති කරවීම.

පොත පත කියවීමට පෙලඹවීම සඳහා ඉහත දැක්වෙන උපක්‍රම භාවිත කළ හැකි ය. මේ තත්ත්වය යාවජීව අධ්‍යාපනයෙහි පදනම ද වන්නේ ය.

## උසස් කලා කෘති හා පොත් පත් ඇසුරෙන් විනෝදාස්වාදය ජනනය කිරීම

පොත පත කියවීමෙන් දැනුමෙන් පරිපූර්ණ වන මිනිසා තිරිසන් භාවයෙන් මුදා හොඳ මිනිසකු බවට පත්කිරීමේ හැකියාව ඇත. සාහිත්‍යය පරිශීලනයෙන් නිහතමානි මුදුමොළොක් කරුණාබර මෛත්‍රී සහගත මුදිතා ගුණැති, හොඳ නොහොඳ දන්නා සංවේදී සත්පුරුෂ ගුණ අප තුළ වර්ධනය වන්නේ ය. "සහිතස්‍ය භාවඃ සාහිත්‍යම්" යන විග්‍රහයේ එන පරිදි සහිත බව හෙවත් රස සහිත වූ බව සාහිත්‍යයයි. එනම් මනා කොට කියන ලද්ද හෝ මනා කොට තබන ලද දේය. සාහිත්‍යයෙහි ප්‍රධාන ශාඛා දෙකක් ඇත. එනම්,

(අ) දැනුම සඳහා සාහිත්‍යය (සියබස්ලකර, සිදත් සඟරාව, එළු සඳැස් ලකුණ)

(ආ) රස නිෂ්පත්තිය සඳහා සාහිත්‍යය (අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, ගුත්තිලය) රස නිෂ්පත්තිය සඳහා වන සාහිත්‍යය නිර්මාණ සාහිත්‍යය යි.

කියවීම හුරුපුරුදු කිරීම පිණිස බාල කාලයේ පටන් ජන සාහිත්‍යය පරිශීලනයට හා ජන කතා හා ජන කවි ආදිය භාවිතයට යොමු කළ හැකි ය. කියවීම ඉගැන්වීම සඳහා ජන සාහිත්‍යය උපයෝගී කර ගත හැකි ආකාරය විමසුමට ලක්කෙරෙන 'විධිමත් අධ්‍යාපනය සඳහා ජන සාහිත්‍යය' (පෙරේරා, 1997. පි. 162) කෘතියෙහි සිංහල ජන සාහිත්‍යය මගින් ළමයින්ගේ කියවීමේ ශක්තිය හා පුරුද්ද වර්ධනය කරන්නක් බව අවධාරණය කෙරේ. ඒ සඳහා යෝග්‍ය ජන කතා නාමාවලියක් ද කතුවරයා යෝජනා කර ඇත. ඒ අනුව ජන සාහිත්‍යය, ජනශ්‍රැතිය, ජන කතා, ජන කවි, ජන කියමන්, ජාතක කතා, බණ කතා හා ගම කතා එහි නිර්දේශිත ය.

ලෝකයේ ඇති සියලු ම කලාවන්ට පාදක වන්නේ සෞන්දර්යයයි. සාහිත්‍ය කලාවෙහි රස විඳ ගැනීමට නොහැකි කලා විහීනයන් ගොනුන්ට සමාන බවත්, ඔවුන් තණ කොළ අනුභව නොකරන්නේ ගොනුන්ගේ වාසනාවට බවත් 6 වන සියවසේ ඉන්දියාවේ විසූ පඬිවරයකු වූ භර්තෘහට්රී පවසා ඇත.

සාහිත්‍ය සංගීත කලා විහීනඃ - සාක්ෂාත් පශුඃ පුච්ඡ විෂාණ හීනඃ
තෘණං න ඛාදන්ති පී ජීවමානඃ - ස්තද් භාගධෙයං පරමං පශූනාම්

සාහිත්‍යය, සංගීතය, කලාව ආදී විෂයයන් කිසිවක් නො දත් තැනැත්තා වල්ගය හා අං නැති ගොනකු හා සමාන බව මෙයින් කියැවෙයි. කලා රසවින්දනයෙහි රිසි වූ සියලු දෙනාම කලාවට පාදක වන සෞන්දර්යයේ රසය විඳගැනීමට කැමැත්තෝ වෙති. සෑම පුද්ගලයකුටම සාහිත්‍යකරුවෙක්, නිර්මාණකරුවෙක්, ලේඛකයෙක්, කවියෙක්, විචාරකයෙක් වීම අපහසු ය. ඒ අනුව සෑම සාහිත්‍යධරයෙක්ම නිර්මාණකරුවෙක් නො වේ. නිර්මාණකරුවෙක් වීමට පොත පත පරිශීලනය කළ යුතු ය.

## කියවීමේ කුසලතා වර්ධනය කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන

කියවීමේ කුසලතා වර්ධනය මගින් ලබා ගත හැකි හා අත්පත් කර ගත හැකි ජයග්‍රහණ රාශියකි. අධ්‍යාපනඥයන්ගේ මතය නම් කියවීමේ පුරුද්ද ඇති කළ යුත්තේ බාලවියේ සිට බවයි. මෙය එක්තරා භාවිතයක් වන අතර, කියවීමේ පරිචය පුරුදු කිරීම සඳහා සුදුසුම ස්ථානය නම් පාසල් පුස්තකාලයයි. භාෂාවක් ඉගෙනීමේ දී ප්‍රගුණ කළ යුතු ක්‍රියාකාරකම් වශයෙන් ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීම (ලේඛනය) දැක්විය හැකි ය. කියවීමේ ප්‍රතිලාභ පහත දැක්වෙන පරිදි කැටි කොට දැක්විය හැකි ය.

1. ලෝක සංස්කෘතිය, අතීත සිතුම් පැතුම් මානව චින්තනය, විශ්ව ඥානය පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලබා ගත හැකිවීම.

2. ඥාන මණ්ඩලය පුළුල්වීමෙන් බාහිර ලෝකය පිළිබඳ පරිඥානය ලැබී මානසික පූර්ණත්වයට පත්වීම.

3. ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය, මිත්‍රත්වය, ආගමික සුහදතාව හා සමාජ සම්බන්ධතා ඇතිකර ගැනීමට හැකිවීම.

4. දැනුම. තොරතුරු, කුසලතා, ඉගෙනුම, පුරවැසි පුහුණුව හා රසඥතාව ආදියෙන් පිරිපුන් වීම.

5. කිසියම් විෂයයක් ඉගෙන ගැනීමේ දී විවිධ විෂයයන් ඇසුරෙන් ලියැවී ඇති කෘති කියවීමට වාසනාව ලැබීම.

6. ෆැන්සිස් බේකන්ට අනුව සම්පූර්ණ මිනිසකු හා අප්‍රමාද මිනිසකු බිහිවන හෙයින් සහජයෙන් ලත් කියවීමේ හැකියාව, කියවීමේ පුහුණුවක් බවට පත්කර ගැනීමට නම් කියවීමේ රුචිය වර්ධනය කර ගත යුතු වීම.

7. අධ්‍යාපන කාර්යයේ මෙන්ම අවිධිමත් අධ්‍යාපනයේ මූලික පදනම කියවීමේ හැකියාව බවට පත්වීම හා කියවීමෙන් තොර ව අද්‍යතන තොරතුරු සමාජයේ ජීවත්වීම අපහසු වීම.

8. ශ්‍රව්‍ය හා දෘශ්‍යාධාර මාර්ගයෙන් ලබා ගන්නා වූ දැනුම ස්ථිර කර ගැනීමට අවශ්‍ය පදනම නිර්මාණය වීම.

9. කියවීමේ කුසලතාව ප්‍රගුණ කළ විට වැදගත් කෘතිවලින් නොවැදගත් කෘති වෙන්කර ගැනීමට හැකිවීම හා තම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කිනම් කෘති කියවිය යුතු ද යන්න නිගමනය කර ගැනීමට හැකිවීම.

ශ්‍රී ලංකාවේ සිටි සාහිත්‍යකරුවන් දෙදෙනකු වන මාර්ටින් වික්‍රමසිංහයන් හා ජී. බී. සේනානායකයන් විශිෂ්ටත්වයට පත් වූයේ පුස්තකාලයම තම සරසවිය බවට පත්කර ගැනීමෙනි. ඔවුන්ගේ ජීවිත කථා පුවත් ඇසුරෙන් ඒ බව පැහැදිලි කර ගත හැකි ය. ස්වයං අධ්‍යාපනය සඳහා මහජන පුස්තකාලවලට සුවිශේෂී කාර්යභාරයක් පැවරේ. යුනෙස්කෝ ප්‍රඥප්තිය අනුව එය පැහැදිලි කර ගත හැකිය. මහජන පුස්තකාලය ජීවමාන හා ජාතීන් අතර අන්‍යෝන්‍ය වැටහීම, සාමය හා සුහදතාව වර්ධනය කිරීමේ ලා උපයෝගී වන පොදු ආයතනයකි. (මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ ප්‍රඥප්තිය 1972)

විවේකය හා විනෝදය සඳහා පොත පත සම්පාදනය කර දීම මහජන පුස්තකාලවල මූලික අරමුණකි. මහජන පුස්තකාල සේවය සඳහා කෙළින්ම පාඨකයාගෙන් කිසිම මුදලක් අය නොකළ යුතු අතර, එය රජයේ මුදල්වලින් පවත්වා ගෙන යායුතු ය. මහජන පුස්තකාලයක අභිමතාර්ථ මෙසේ දක්වා ඇත.

"මහජන පුස්තකාලය අනවරතයෙන් ම ජාති භේද, ආගම් භේද, සමාජ හා ජීවන තත්ත්ව භේද ඉක්ම වූ ආයතනයක් ලෙස පවත්වා ගෙන යායුතු ය". (ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනය : මහජන පුස්තකාල ප්‍රමිති. 1977 පිටු 1-2)

සමස්ත සමාජයක ගමන්මඟ සුමඟට හරවා විශිෂ්ට පුද්ගලයකුගෙන් යුතු සමාජයක් බිහිකිරීමට නිහඬව සේවය කිරීමේ ඇති හැකියාව අභිමානවත් ව පොදු ජනතාවගේ විශ්වවිද්‍යාලය ලෙස හැඳින්වෙන මහජන පුස්තකාලය වෙත පැවරී ඇති ජාතික වගකීමකි.

## පුස්තකාලයේ කාර්යභාරය හා නිගමනය

කියවීමේ කුසලතා වර්ධනය කිරීමටත්, පොත් ලෝකයෙහි රන් දොරටුව විවර කිරීමටත්, අධ්‍යාපනයේ මැණික් කැට ඇති ස්ථාන පෙන්වාදීමට වැඩි ශක්‍යතාව ඇත්තේ පුස්තකාලයවලට හා පුස්තකාලයාධිපතිවරුන්ටම ය. ඉගෙනුම් හා කියවීමේ කුසලතා වැඩි දියුණු කිරීම් පිණිස පුස්තකාලය මගින් සැලැසුම් කොට ක්‍රියාත්මක කළ යුතු සේවාවන් කීපයක් පහත සඳහන් වේ.

1. සැලැසුම්ගත පුස්තකාල සේවා සංවිධානය හා පුස්තකාලය සැමටම විවෘත කිරීම.

2. දැනුම, අධ්‍යාපනය, ආකල්ප හා රසාස්වාදය වර්ධනය පිණිස සේවා සංවිධානය කිරීම.

3. පුස්තකාල පරිහරණය, දැනුම සංවිධානය, ඉගෙනුම් කුසලතා හා කියවීමේ රසාස්වාදය පිළිබඳ පාඨක ජනතාව දැනුම්වත් කිරීම.

4. පුස්තකාලය තොරතුරු මධ්‍යස්ථානයක් බවට පත්කිරීම හා පොත් ලෝකය හඳුන්වා දීම.

5. පුස්තකාල පුරුදු වැඩි දියුණු කිරීමෙන්, ඥාන ගවේෂණ කුසලතා දියුණු කිරීමෙන්, අවිධිමත් අධ්‍යයන අවස්ථා සංවර්ධනය පිණිස මඟ පෙන්වීම හා පාඨක අවශ්‍යතා අනුව කටයුතු කිරීම.

6. ස්වයං අධ්‍යයන/ස්වයං ඉගෙනුම පිණිස විමර්ශන කෘති පරිහරණය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙන්ම පාඨකයා මිතුරකු ලෙස සලකා පාඨක අවශ්‍යතා නිසි පරිදි ඉටුකර ගැනීම පිණිස ආධාරෝපකාරී වීම.

7. කියවීමට අවශ්‍ය පහසුකම් සපයමින් අධ්‍යාපන හා විඥාපන සේවා මෙන්ම ව්‍යාප්ති (විස්තෘත) සේවා සංවර්ධනය හෙවත් පුස්තකාලය පාඨකයා වෙතට යමින් පාඨක ජනතාවගේ බුද්ධිමය, ආකල්පමය, සංවේදනාත්මක හා චරිතමය සංවර්ධනය ඇතිකිරීමට දායක වීම.

ලේඛන සම්ප්‍රදායයේ ආරම්භයත් සමඟම පුස්තකාල සේවයට අවශ්‍ය පදනම නිර්මාණය වී ඇත. රාජ්‍ය ලේඛන භාරකාරිත්වය සමඟම ලේඛන සුරක්ෂිත කිරීමේ සම්ප්‍රදාය ආරම්භ විය. ඈත අතීතයේ සිට පුස්තකාල විසින් කරන ලද සේවාව වර්තමාන සමාජ, දේශපාලන හා ආර්ථික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් නවීකරණය විය යුතු ය. පුස්තකාල සේවාව ද ඇනුමෙන් පෝෂිත රටක් වශයෙන් ඉදිරියට පිය නඟන වැඩ පිළිවෙළක ඉදිරිපෙළ කාර්යභාරයක් හා වගකීමක් භාර ගත යුතු ය.

**පාදක සටහන්**


අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (2003), පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය හෙවත් පාලි අට්ඨකතාවලින් අනාවරණය වන ලංකාවේ බුදුසමයේ තත්ත්වය. කොළඹ : ඇස්. ගොඩගේ, පි. 75

ජයවීර, ඒ. එම්. එස්. (1996), ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විෂයමාලාව. පල්ලේවෙල : කර්තෘ, පි. 20

ජයසේකර, යූ. ඩී. (1997). අධ්‍යාපන චින්තන. කොළඹ : ඇස්. ගොඩගේ, පි. 108

ද සිල්වා, ඇම්. ඇල්. (2009), භාව සන්න සහිත සිරිත් මල්දම, අලව්ව : සිඟිති ප්‍රකාශකයෝ, පි. 9

පඤ්ඤාලෝක හිමි, මීගොඩ (2002), ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹ : ඇස්. ගොඩගේ, පි. 15

පෙරේරා, ජී. සී. (1997). විධිමත් අධ්‍යාපනය සඳහා ජන සාහිත්‍යය. කොළඹ : ඇස්. ගොඩගේ, පි. 162

Senevirathna, John M. (2005), Dictionary of proverbs of the Sinhalese including also their Adages...... New Delhi : Asian Educational Services, p.13


**ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන**


අදිකාරි, අබයරත්න (2002), ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන. නුගේගොඩ : තිවිර ප්‍රකාශන

උඩගම, ප්‍රේමදාස (2003), නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය : ඇගයුම්, අභියෝග හා අපේක්ෂා. කොට්ටාව : සාර ප්‍රකාශන

කරුණාරත්න, ඩේවිඩ් (1960), සිංහල සාහිත්‍ය විශ්වකෝෂය, කොළඹ : ඇම්. ඩී. ගුණසේන

කෝපරහේවා, සඳගෝමි (2006), ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රම : ශාස්ත්‍රීය ලේඛන මූලධර්ම -1, කොළඹ : ඇස්. ගොඩගේ

ගණ දෙවි හැල්ල සහ වදන් කවි පොත (1979), සංස්. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය (2005), සම්. විජයතුංග, හරිස්චන්ද්‍ර. කොළඹ : ඇම්. ඩී. ගුණසේන

තිලකසිරි, ජේ. (1988). වෛදික සාහිත්‍යය. කොළඹ : ඇස්. ගොඩගේ

ද සිල්වා, ඇම්. ඇල්. (2009), භාව සන්න සහිත සිරිත් මල්දම, අලව්ව : සිඟිති ප්‍රකාශකයෝ,

පල්ලියගුරු, චන්ද්‍රසිරි (2007), පැරණි සිංහලයේ අධ්‍යාපනය. හෙළ ගොස : සිංහලයේ සැබෑ උරුමය සොයා, කොළඹ : සේසත ප්‍රකාශන

පාලි-සිංහල ශබ්දකෝෂය (1965), සම්. සිරි සුමංගල හිමි, මඩිතියවෙල. කොළඹ : ඇම්. ඩී. ගුණසේන

බුද්ධදත්ත, පොල්වත්තේ (1959), ඌන පූරණ සහිතො මහාවංසො. කොළඹ : ඇම්. ඩී. ගුණසේන

මූලික පිරිවෙන් පොත් ..... (1988), සම්. ගම්ලත්, සුචරිත, අධිකාරි, ඒ. කොළඹ : ඇස්. ගොඩගේ

රණසිංහ, ආර්. එච්. අයි. එස්. (2006), පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය : ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහතුන් වන සියවස දක්වා. කැලණිය, කර්තෘ රත්නාර්ථ සූධනී නම් වූ සිංහල ධම්මපදය (2001), සංස්. ගුණරත්න, එල්. කොළඹ : රත්න පොත් ප්‍රකාශකයෝ

ලියනගේ, සිරි (20 ?), නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය, කොළඹ : ඇස්. ගොඩගේ

සෙනෙවිරත්න, අනුරාධ (2001), සිංහල ශිෂ්ටාචාරයේ උදාගිර මිහින්තලාව. කොළඹ : ඇස්. ගොඩගේ

සේනාධීර, සිල්වි. (2008). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශය. කොළඹ : ඇස්. ගොඩගේ

සෝරත හිමි, වැලිවිටියේ (1999), ශ්‍රී සුමංගල ශබ්දකෝෂය 1, කොළඹ : ඇස්. ගොඩගේ

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1963), සිංහල විශ්වකෝෂය, පළමුවන කාණ්ඩය (අ-අයිසො). කොළඹ : සංස්කෘතික දෙපාර්තමේන්තුව

Oxford Dictionary of English (2003) ed. Catherine Soanes, Augus Stevenson, Oxford : Oxford University Press

Piyadasa, T. G. (1985), Libraries in Sri Lanka : Their Origin and History from ancient times to the present time. Delhi : Sri Satguru Publications

Rahula Thero, Walpola (1966), History of Buddhism in Ceylon : the Anuradhapura period (3rd C.B.C – 10th C.A.C.), Colombo : Gunasena

# THE CHALLENGES FACING LIBRARIANS IN THE PRESERVATION OF LIBRARY MATERIALS AND POSSIBLE SOLUTIONS

**Dr. K. D. G. Wimalaratne**
Retd. Director,
Department of National Archives

The librarians are facing many challenges in their libraries in order to preserve the library materials under their care. The main task of a librarian is to preserve in optimum conditions. The various types of information contents therein in a most efficient way. In one sense, they are information handlers, catering for a large number of clients who are expecting information, Viz; The public or the readers.

The problems they face are complex, as library materials are varied, from paper as well as Audio-Visual and Electronic, created in millions. Many librarians are trained to preserve paper based library materials, but tackling the new media becomes more problematic. In some libraries, still the paper based materials, such as books, Journals, Maps, Plans and the like are deteriorating due to the inability of the librarians to take care of them.

The recent research in the field of taking care of the various library materials have shown differences of the terms used by the librarians, specially, "Preservation" "Conservation" and "Restoration". Many librarians use the terms "Preservation" and "Conservation" interchangeably thinking they are more or less the same. We will now examine the intricate differences in the above mentioned terminology.

## What is preservation?

Passive protection of library materials, in which no physical or chemical treatment to the time occurs. This would mean as the totality of processes and operations involved in the protection of records against damage or deterioration.

## What is Conservation?

It is defined as intrusive protection of library materials by the minimal physical and chemical treatment necessary to resist further deterioration which will not adversely affect the intergrity of the original.

## What is Restoration?

The Restoration of library materials when preservation and conservation has failed is defined as repair of library materials when they are threatened with destruction and breaking down the appearance of its originality. Restoration is to bring back the originality and integrity of the material, prolonging its life for a further period of time.

## Preservation Activities

The famous saying in the medical field, "prevention is better than cure" could be aptly applied to the library field is rather neglected by many librarians in Sri Lanka. Due to this neglect, where preservation activities cost minimum of their annual budget, they go in for costly conservation and restoration programmeis.

If we look at the proper preservation programme, security of the library building, maintaining ideal temperatures and humidities appropriate for the deposited materials, racking made of alumetal material, efficient daily vigilance for hazards, viz, insects, dust, readers, acidity etc. to name a few. The construction of library buildings near a arriver, sea earth quakes, vehicular traffic moving areas should be avoided. The above natural disasters cannot be prevented in many instances. The materials and equipment used in a library should be good quality, selected by qualified professionals. The damages caused by photocopying to be discontinued, and instead scanning equipment to be used to serve the needs of the readers and preservation purposes of the paper based materials.

A better insulation of electrical wiring and covering the heat of the bulbs by filtration would avoid force hazards, If occur, have no restoration techniques for charred books and documents, and even audio-visual and electronic material.

## Why conservation ?

If a library is going in for a costly conservation programme, it reflects the failure of the preservation programme and involves professionally qualified manpower in order to achieve its goals.

When undertaking a conservation programme, a librarian will have to undertake the operation of deacidification for acidity in paper and mould or mildew. How many librarians would know the modern techniques of fumigation for insects? As there is no chemical to spray directly on the books infested with insects, fumigation by using techniques such as nitrogen or deep freezing of paper material to be used. The use of "phostoxin" tablets or " Red Earth" an aqua fumigant in a vacuum chamber is yet to be realized by many librarians. How many would know to practice the "bag fumigation" using local insecticides, such as citronella or cinnaman oil and also household insecticides.

Librarians use and practice the traditional deacidification chemical, viz, calcium hydroxide and secondly calcium bicarbonate. This is a dilatory and a cumbersome method, which needs wetting the paper based material in the above solution and drying thereafter. A book has to be stripped of its pages for the bath, documents or books with running ink face danger, in the solution, The use of Dr. R.D. Smiths "methyl magnesium carbonate (M.M.C), evaporating deacidification solution is yet to be realized in the libraries of Sri Lanka. The use of powerful insecticides, such as "ARS-MITE" up "Bathion" powder "Admiral SL 200" or " Solfac wp 10% for termites, ultrasonic insect repellent devices are to be encouraged among librarians. The environmental factors, such as temperature, humidity have to be controlled by air-conditioning and dehumidifiers. How many libraries use air-conditioning at least exhaust fans?

To battle the fire hazards have to be faced with using not only fire and smoke detector, but also fire extinguishers simultaneously. The library has to be equipped with water-based, from based and more important "Nitrogen gas" which is very effective in fighting a fire. The dependence on other fire fighting institutions has to be minimized, as they arrive at the scene rather late when fire occurs. The library staff has to be trained in fire fighting. How many libraries have planned disaster planning programmes and practice them on and off ?

The water hazard may threaten the library materials by way of water used in the extinguishing a fire in a library or Tsunami disaster during recent times. Specially the libraries in the coastal areas should be trained to face a Tsunami. The new system of "sublimation" using deep-freezing and drying technique developed by Peter

Waters to be familiarized among the librarians and the necessary costly equipment to be either imported by the state or made to specifications in this country. One or two mobile units to perform the sublimation technique is necessary with trained personnel either attached to the National Archives or the National Library.

Digitization for either preservation or conservation is a sine qua non in the National Archives, National Library and other Municipal Council Libraries. This programme to be done by experts in the IT field where legal aspect of digitization to be carefully looked into by the professionals.

## Is repair or restoration is necessary ?

